**එල්ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

එල්ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ්හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් ආයතන වෙත ණය ලබා දීමට සමාගමට නීත්‍යානුකූල හිමිකම් නොමැති වුවද, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඇල්කඩුව වැවිලි සමාගම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, රාජ්‍ය සම්පත් ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය හා රබර් නිෂ්පාදන අපනයන සංස්ථාව වෙත සමාගම විසින් එකතුව රු.මිලියන 105ක ණය මුදල් 2010 වර්ෂයේ දී ලබා දී තිබුණි. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2014 වර්ෂයේදී අදාළ සමාගම්වලින් පොලිය ද ඇතුළුව අය වීමට තිබූ රු.මිලියන 119.758ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන වල පූර්ණ ප්‍රතිපාදන වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට පොලිය ද ඇතුළුව අයකර ගැනීමට නොහැකිව තිබූ සම්පූර්ණ ණය මුදල රු.මිලියන 190.157ක් විය. | හලාවත වැවිලි සමාගම විසින් 2010 වර්ෂයේදී රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ එවකට සිටි ලේකම්වරයාගේ උපදෙස් පරිදි සහ මහා භාණ්ඩාගාරයේ ද එකඟතාවය මත මෙම රාජ්‍ය ආයතන වෙත ඔවුන්ගේ අත්‍යවශ්‍ය මූල්‍ය කටයුතු සඳහා මූල්‍ය පහසුකම්/ණය ලෙස අරමුදල් ලබා දී තිබුණි. අදාළ ණය මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ණය ලබා දුන් වර්ෂයේ සිට විවිධ උත්සහයන් දරා ඇත. කෙසේ වුවද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් මේ සඳහා පූර්ණ ප්‍රතිපාදන සලසා ඇත. | සමාගමේ අරමුණු වලට අනුකූලව කටයුතු කළ යුතු අතර ලබා දී ඇති ණය මුදල් හා පොළී අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.302,606,407 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.513,881,001 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 211,274,594 ක එනම් සියයට 41 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පොල්, කජු, බීජ සහ පොල් පැළ යනාදි බෝග වගාවන්හි විකුණුම් පිරිවැය පිළිවෙලින් රු.මිලියන 82 ක,රු.මිලියන 41ක සහ රු.මිලියන 16ක වැඩිවීම හා පොල් විකුණුම් ආදායම රු.මිලියන 126ක අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

| | 2023 (රු) | 2022 (රු) | විචලනය (රු) | විචලනයේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|
| අයභාරය | 899,693,759 | 975,106,419 | 75,412,660 | 8 |
| මූල්‍ය හා අනෙකුත් ආදායම් | 341,545,704 | 332,435,788 | 9,109,916 | 3 |
| විකුණුම් පිරිවැය | 671,910,856 | 520,940,365 | 150,970,491 | 29 |
| පරිපාලන වියදම් | 205,069,246 | 229,027,818 | 23,958,572 | 10 |
| මූල්‍ය වියදම් | 61,652,953 | 43,693,022 | 17,959,931 | 41 |

**2.3 අනුපාත විශ්ලේෂණය**

- සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතයන් පිළිවෙලින් 4:1 ක් සහ 3:1ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතයන් 4:1 ක් හා 3:1ක් වී තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 25 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතය වූ සියයට 47 සමඟ සැසදීමේදී දළ ලාභ අනුපාතය සියයට 22 කින් පිරිහී තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ලාභ අනුපාතය සියයට 26 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතය වූ සියයට 51 සමඟ සැසදීමේදී ශුද්ධ ලාභ අනුපාතය සියයට 25 කින් පිරිහී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියැදි පරීක්ෂාවකට අනුව විගණිත දිනට වතුයායන් 03 කට අදාළව අක්කර 839ක ඉඩම් ප්‍රමාණයක් අතිරේක භෝග වගාවන් සඳහා කල් බදු පදනම මත බාහිර පාර්ශවයක් වෙත ලබාදීමට අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වුවද කුමන ඉඩම් කුමන පුද්ගලයින් වෙත බදු දෙනවාද යන්න පිළිබඳ සමාගමේ ප්‍රතිපත්තියක් හෝ ක්‍රමවේදයක් නොතිබුණි. | එක් පොල් අල්ලියක ඉඩම් ප්‍රමාණයෙන් 83% ක පමණ ඉඩම් කොටසක් ප්‍රයෝජනයට නොගෙන හිස් ඉඩකඩක් ලෙස පවතින නිසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවා එම නිර්ණායක ඔස්සේ ලැබෙන අයදුම්පත් සමාගම පත් කළ කමිටුවකට යොමු කර සුදුසු අයදුම්කරුවන් තෝරාගනු ලැබීමෙන් පසු තැන්පතුවකට හා ගාස්තුවකට යටත් ව ගිවිසුම්ගතවී මෙම ඉඩම් ලබාදී ඇත. ගිවිසුමේ කොන්දේසි අනුව ගිවිසුමට ඇතුළත්වීම මඟින් අයදුම්කරුවන්ට කිසිවිටෙකත් විෂයගත දේපල පිළිබඳව හිමිකමක් හෝ භුක්තියක් නොපැවරෙනු ඇත. | උප බදු දීම සඳහා තෝරාගන්නා ඉඩම් හා පුද්ගලයින් පිළිබඳ සමාගමේ නිශ්චිත ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් සකස් කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පොල් අලෙවිය මත පදනම්ව එක් එක් කලාපවලට අදාළව 2023 සහ 2022 වර්ෂයන්හි පිළිවෙලින් රු.12,968,208ක් හා රු.14,779,102ක් විකුණුම් කොමිස් ලබා දී තිබුණි. පොල් වෙන්දේසියට පොල් ඵලදාව ඉදිරිපත් නොකර සමාගමේ කාර්යමණ්ඩලයට කොමිස් ගෙවීම මඟින් ප්‍රතිලාභ ඉහළ නංවා ගැනීම සඳහා අනුමත ක්‍රමවේදයක් හෝ ප්‍රතිපත්තියක් විගණනයට ඉදිරිපත් නොවීය. | මෙම කොමිස් මුදල ලබා දීම තුළින් ඉහළ ඵලදායිත්වයකින් යුතු සේවයක් වතු අධිකාරීන්ගෙන් හා ක්ෂේත්‍රගත නිලධාරීන්ගෙන් ලබා ගත හැකි අතර ඉහළ ආදායමක් ලැබෙන විට ඉහළ ප්‍රතිලාභයකුත් එය පහළ යන විට පහළ ප්‍රතිලාභයකුත් ලැබෙනු ඇත. | පොල් වෙන්දේසිය මඟින් හැකිතාක් තරඟකාරීව විකුණුම් වැඩිකර ගැනීමට හා හොඳ මිලක් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර සමාගමේ නිලධාරීන්ගේ කාර්යභාරය වෙනුවෙන් සිදු කරන ලද අමතර ගෙවීම් සඳහා අනුමත ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හලාවත වතු කලාපයේ සීනසොල පතසෙහි පස් කියුබ් 5000ක ප්‍රමාණයක පස් ඉවත් කිරීම සඳහා 2021 වර්ෂයේදී කොන්ත්‍රාත් ලබාදී තිබුණු අතර 2021 වර්ෂයේදී කියුබ් 1,212ක් කපා රු.1,030,200ක ආදායමක් ඉපයිමට ද ගිවිසුම් ගතව තිබුණද එය අතර මඟ නවතා දමා ගොස් තිබුණු අතර 2024 ජූලි 19 දින භෞතිකව පරීක්ෂා කරන දිනය වනවිටත් එම පතසෙහි කටයුතු ආරම්භකර නොතිබුණි. | සීනසොල පතස ප්‍රතිසංස්කරණය කිරීමට අදාලව 2021 වර්ෂය තුළ පස් කියුබ් 1,212 ක් පමණක් ඉවත්කර තිබීම මත ඇතිවූ ගැටළුකාරී තත්ත්වය මත ගිවිසුම් ප්‍රකාරව බේරුම්කරණයක් පවත්වා ගිවිසුම අවලංගු කරන ලදී.<br>පතසෙහි වැඩකටයුතු සම්පූර්ණ කර ගැනීමට අවස්ථා කිහිපයකදීම ටෙන්ඩර් කැඳවූ නමුත් මෙතෙක් ඊට ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් නොවීය.<br>සීනුගල වත්තෙහි දැනට කැණීම් සිදුකරනු ලබන ස්ථානය පුරාණ වැවක් වශයෙන් පවතී. එහි ගොඩ වී ඇති රොන් මඩ සමඟ යම් ප්‍රමාණයකට සැලැස්මක් ඇතිව පුළුල් කිරීමක් මෙම ව්‍යාපෘතිය හරහා සිදු වේ. මෙම කුඩා වැව පිළිසකර කිරීමෙන් වත්තේ භූගත පාංශු ජල මට්ටම පාලනය කිරීමට / ඉහළට ඔසවා තබා ගැනීමට බෙහෙවින් උපකාරී වනු ඇත. | පතස් කැණීම සඳහා සුදුසු පළපුරුදු හා විශ්වාසී කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමටත් ඵලදායී සැලසුම් සකස් කිරීමටත් සමාගම විසින් කටයුතු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විධිමත් අනුමැතියකින් තොරව දිනකට රු.900ක දෛනික වැටුප් ගෙවීමේ පදනම මත වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින්ද ඇතුළුව සේවකයින් 23 දෙනෙකු බඳවා ගැනීමට වතු අධිකාරීන් විසින් කටයුතු කර තිබුණි. | සේවකයන් අවුරුදු 60 දක්වා සේවය කර විශ්‍රාමයාමේදී නැවත සේවය කිරීම සඳහා සිදුකරනු ලබන ඉල්ලීම සලකා බලා, නව සේවකයන් බඳවා ගැනීමට ඇති දුෂ්කරතාවයද සැලකිල්ලට ගෙන සහ වතුයායේ වියදම් අවම කර ගැනීමේ චේතනාවෙන් තාවකාලික පදනම මත මෙම බඳවා ගැනීම් සිදු කිරීමට වතු අධිකාරී විසින් කටයුතු කර ඇත. | සමාගමේ බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල වන පරිදි නිසි අධිකාරී අනුමැතිය මත බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද කාර්යය මණ්ඩලය ඉක්මවා දෛනික වැටුප් පදනම,කොන්ත්‍රාත් පදනම සහ සාමූහික ගිවිසුම් මත සමාගමේ කාර්යයමණ්ඩලයට සේවකයින් 141ක් දෙනෙකු බඳවා ගෙන තිබුණි. | සාමූහික ගිවිසුම අනුව ලිපිකරු සේවයේ, ක්ෂේත්‍රගත සේවයේ, උපකාරක / සහායක කාර්ය මණ්ඩල, ට්‍රැක්ටර් රථ රියදුරු යන අය සේවයේ යොදවා ඇති අතර දෛනික වැටුප් පදනම මත ප්‍රධාන ලිපිකරු තනතුරු දෙකක්, ස්ථාන භාර නිලධාරී තනතුර සඳහා එක් සේවක මහතෙකු,<br>ට්‍රැක්ටර් රථ රියදුරු සේවයේ එක් සේවක මහතෙකු හා සහකාර වතු අධිකාරී තනතුරේ දෙදෙනෙකු සේවය කරයි. | සමාගමේ කාර්යමණ්ඩල අවශ්‍යතාවය මත මානව සම්පත් සැලැස්මක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන විධිමත් පරිදි බඳවා ගැනීම් සිදු කළ යුතුය. |